අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/03/05 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2026.06. 08

**චක්‍රලේඛ අංක : 18/2026**

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන අතරතුර පෞද්ගලික අවශ්‍යතා සඳහා දෙමාපියන්/භාරකරුවන් සමග විදේශගත වන සිසුන් සඳහා විදේශ නිවාඩු ලබා දීම**

රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන සිසුන් පෞද්ගලික අවශ්‍යතා සඳහා දෙමාපියන්/භාරකරුවන් සමග විදේශගත වීමේ දී විදේශගත වන සිසුන් සඳහා නිවාඩු සම්බන්ධව නිකුත් කර ඇති 2002.10.04 දිනැති අංක එච්ආර්ඩී/ඊකිව්ඩී/2002/26 දරන චක්‍රලේඛය, 2000.06.06 දිනැති අංක 2000/29 චක්‍රලේඛය, 2000.11.22 දිනැති අංක 2000/29 (1) චක්‍රලේඛ සංශෝධනය, 1990.08.22 දිනැති අංක 1990/25 චක්‍රලේඛය ඇතුළු ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශය විසින් මෙයට පෙර නිකුත් කර ඇති සියලු ම චක්‍රලේඛ අවලංගු කර මෙම චක්‍රලේඛයේ උපදෙස් රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන අතරතුර පෞද්ගලික අවශ්‍යතා සඳහා දෙමාපියන්/භාරකරුවන් සමග විදේශගත වන සිසුන් සඳහා විදේශ නිවාඩු අනුමත කිරීම සම්බන්ධයෙන් මින් ඉදිරියට බලපැවැත්වෙනු ඇත.

2.0. සියලු ම රජයේ පාසල්වල 1 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය (අ.පො.ස. (උ. පෙළ.) විභාගයට පළමු වරට පෙනී සිටින තෙක්) දක්වා ශ්‍රේණිවල අධ්‍යාපනය හදාරන සිසුන් විදේශගත වීමේ දී **විදේශගත වන සම්පූර්ණ කාලය සඳහා එකවර අනුමැතිය ලබාගත යුතු අතර එම කාලය වර්ෂ දෙක නො ඉක්මවිය යුතු ය.**

2.1. සිසුන් විදේශගත වීමේ දී ඒ සඳහා අනුමැතිය ලබා දීම පහත සඳහන් නිලධාරීන් විසින් සිදු කළ යුතු ය.

| **විදේශගත වන කාල සීමාව** | **අනුමැතිය ලබා දිය යුතු නිලධාරියා** | |
|---|---|---|
| | **ජාතික පාසල්** | **පළාත් පාසල්** |
| දින 31 දක්වා | විදුහල්පති | විදුහල්පති |
| දින 31 ට වැඩි සහ මාස හය හෝ ඊට අඩු | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| මාස හයට වැඩි සහ වර්ෂයක් හෝ ඊට අඩු | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| වර්ෂයකට වැඩි සහ වර්ෂ දෙක දක්වා | අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |

**2.2. විදේශගත වන කාල සීමාව දින 31 දක්වා අනුමැතිය ලබා දීම**

විදේශගත වන කාලය දින 31ක් හෝ ඊට අඩු නම්, එම විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම සිසුවා අධ්‍යාපනය ලබන පාසලේ විදුහල්පති විසින් සිදු කළ යුතු වන අතර, ඒ සඳහා ඇමුණුම 01හි සඳහන් ආකෘති පත්‍රය සම්පූර්ණ කර අදාළ පාසලේ විදුහල්පති වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**2.3. විදේශගත වන කාල සීමාව දින 31 ට වැඩි සහ මාස හය හෝ ඊට අඩු කාල සීමාව අනුමැතිය ලබා දීම**

විදේශගත වන කාලය දින 31 (මාස 01) ට වැඩි නම් සහ මාස හය දක්වා නම්, එම විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම සිසුවා අධ්‍යාපනය ලබන පාසල පිහිටි අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු වන අතර, ඒ සඳහා ඇමුණුම 01හි සඳහන් ආකෘති පත්‍රය පිටපත් දෙකකින් සම්පූර්ණ කර අදාළ පාසලේ විදුහල්පතිගේ නිර්දේශය සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**2.4. විදේශගත වන කාල සීමාව මාස හයට වැඩි සහ වර්ෂයක් හෝ ඊට අඩු කාල සීමාව සඳහා අනුමැතිය ලබා දීම**

විදේශගත වන කාලය මාස හයේ සිට වර්ෂයක් දක්වා වන්නේ නම්, එම විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම සිසුවා අධ්‍යාපනය ලබන පාසල පිහිටි පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු වන අතර, ඒ සඳහා ඇමුණුම 01හි සඳහන් ආකෘති පත්‍රය සම්පූර්ණ කර අදාළ පාසලේ විදුහල්පතිගේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ නිර්දේශය සහිත ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**2.5. විදේශගත වන කාල සීමාව වර්ෂයකට වැඩි සහ වර්ෂ දෙක දක්වා කාල සීමාව සඳහා අනුමැතිය ලබා දීම**

වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වීමේ දී පළාත් පාසලක සිසුන් නම් ඒ සඳහා සිසුවා අධ්‍යාපනය ලබන පාසල පිහිටි පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද, ජාතික පාසලක සිසුන් නම් අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) ගේ ද අනුමැතිය ලබාගත යුතු ය. ඒ සඳහා ඇමුණුම 01හි සඳහන් ආකෘති පත්‍රය සම්පූර්ණ කළ යුතු අතර, පළාත් පාසලක සිසුන් විදුහල්පති ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ නිර්දේශ සහිත ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, ජාතික පාසලක සිසුන් විදුහල්පති ගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ නිර්දේශ සහිත ව අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙත ද අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

3.0 රජයේ අවශ්‍යතා මත විදේශගත වන (විදේශ දූත මණ්ඩල රාජකාරි, අනිවාර්ය වෛද්‍ය පුහුණු, අනිවාර්ය හමුදා පුහුණු, හෝ වෙනත් රජයේ අවශ්‍යතා) නිලධාරීන්ගේ දරුවන් සඳහා සේවා අවශ්‍යතාව මත වර්ෂ දෙක ඉක්මවා විදේශ නිවාඩු අයදුම් කරන්නේ නම්, තොරතුරු සනාථ කරන ලේඛන සහිත ව එම ඉල්ලීම මෙම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

4.0 තමා විසින් විදේශ නිවාඩු නිර්දේශ කරන ලද හා අනුමත කරන ලද සිසුන් පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු ඇතුළත් වාර්තාවක් පාසලෙහි පවත්වා ගෙන යා යුතු අතර, ඇමුණුම 02හි සඳහන් ආකෘතිය පරිදි සකස් කරන ලද එම වාර්තාවේ පිටපතක් සෑම මාස තුනකට වරක් ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යොමු කිරීමට සියලු ම විදුහල්පතිවරුන් කටයුතු කළ යුතු ය.

5.0 පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වූ අධ්‍යයන වර්ෂයේ දී මාස හය හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා විදේශ නිවාඩු ලබා නො දිය යුතු ය.

6.0 වර්ෂයකට හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා විදේශ නිවාඩු ලබාගත් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක නැවත මාස හය හෝ ඊට වැඩි කාලසීමාවක් සඳහා විදේශ නිවාඩු ඉල්ලුම් කරන්නේ නම් අවම වශයෙන් වර්ෂයක කාලසීමාවක් මෙරට රජයේ පාසලක අධ්‍යයන කටයුතුවල නිරත වී සිටිය යුතු ය.

7.0 මෙම චක්‍රලේඛයේ 3.0 යටතේ දක්වා ඇති රජයේ අවශ්‍යතා මත විදේශගත වන නිලධාරීන්ගේ දරුවන් සඳහා ඉහත 5.0 හා 6.0 වගන්ති අදාළ නොවේ.

8.0 විදේශ නිවාඩු සඳහා අයදුම් කිරීමේ දී අවම වශයෙන් විදේශගත වීමට සති 02 කට පෙර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. විදේශ නිවාඩු අනුමත කර ගැනීමකින් තොර ව විදේශගත විය නොහැකි අතර, එවැනි සිසුන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් 2023.12.29 දිනැති ව නිකුත් කර ඇති අංක 53/2023 චක්‍රලේඛයෙහි 2.1.6 වගන්තිය අනුව කටයුතු කළ යුතු ය.

**(2.1.6 වගන්තිය : දෙමාපිය/භාරකරුවන්ගේ කිසිදු දැනුම්දීමක් නොමැතිව යම් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක පාසල් පවත්වන දින 40ක කාලයක් අඛණ්ඩව නො පැමිණිය හොත් ඔහු පාසලෙන් ඉවත් වී ගිය ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක ලෙස සලකා කටයුතු කළ යුතු වේ. එබඳු ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක පාසලෙන් අස් වූ දිනය ලෙස සැලකිය යුත්තේ පාසල් නො පැමිණි 41වන දිනය වේ. ඊට අමතරව මෙය Education C-32 ලේඛනයේ 31,32,33 තීරුවල නො පමාව අදාළ සටහන් තැබිය යුතු ය.)**

9.0 අනුමත විදේශ නිවාඩු කාලසීමාව අවසන් වූ පසු පාසල පවත්වන දින හතක් ඇතුළත නැවත පාසලට නො පැමිණෙන දරුවන් පාසලෙන් ඉවත් වී ගිය ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක සේ සැලකිය යුතු ය. **එබඳු ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක පාසලෙන් අස් වූ දිනය ලෙස සැලකිය යුත්තේ පාසල් නො පැමිණි අටවන දිනය වේ. ඊට අමතරව මේ පිළිබඳ ව Education C-32 ලේඛනයේ 31,32,33 තීරුවල නොපමාව අදාළ සටහන් තැබිය යුතු ය.**

10.0 උක්ත 8.0 හා 9.0 අනුව පාසල් නාම ලේඛනයෙන් නම ඉවත් කර ඇති අවස්ථාවල දී යළිත් පාසලකට ඇතුළත් කිරීම සඳහා පදිංචි ස්ථානය අයත් අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්පතක් ඉදිරිපත් කර සුදුසු පළාත් පාසලක් ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

11.0 මෙම චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටලුවක් පිළිබඳ ව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

12.0 මෙම චක්‍රලේඛයේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

නාලක කලුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. විගණකාධිපති
4. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
8. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්

ඇමුණුම 01

## රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන අතරතුර දෙමාපියන්/භාරකරුවන් සමග විදේශගත වන සිසුන් සඳහාවන නිවාඩු ඉල්ලුම් කිරීමේ අයදුම්පත

**( 01 ශ්‍රේණියට ඇතුළත් වීමෙන් පසු හා අ.පො.ස. (උ.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටින දින තෙක්)**

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ..................චක්‍රලේඛය අනුව)

නම:-..........................................................................................................................................
(මව/පියා/නීත්‍යානුකූල භාරකරු)
ලිපිනය :-....................................................................................................................................

.....................................................................................................................................................

දුරකථන අංකය :-...........................................................................................................................
විද්‍යුත් ලිපිනය (E-mail) :-.............................................................................................................

20..............................................දින

විදුහල්පති

.........................................................................විද්‍යාලය

1. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම් ශ්‍රේණිය හා පන්තිය

| | | |
|---|---|---|
| I. | ........................................................................ | .............................. |
| II. | ........................................................................ | .............................. |
| III. | ........................................................................ | .............................. |

2. විදේශගත වන කාරණය පැහැදිලිව හා විස්තර සහිත ව

   ..........................................................................................................................................
   ..........................................................................................................................................
   ..........................................................................................................................................
   ..........................................................................................................................................

3. විදේශගත වන රට/රටවල් :- ......................................................................................................

4. නිවාඩු කාල පරිච්ඡේදය :- 20.......................... සිට 20..........................දක්වා

5. විදේශගත වන කාලය ඉදිරියෙන් √ ලකුණ යොදන්න

   - ☐ දින 31 දක්වා
   - ☐ දින 31 ට වැඩි සහ මාස 06 හෝ ඊට අඩු
   - ☐ මාස 06 ට වැඩි සහ වර්ෂයක් හෝ ඊට අඩු
   - ☐ වර්ෂයකට වැඩි සහ වර්ෂ දෙක දක්වා

ඔබ පාසලේ ඉහත නම/නම් සඳහන් සිසුවා/සිසුන් මා සමග විදේශගත වන බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස හා විදේශ නිවාඩු අනුමත ලිපිය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

..............................................................
මව/පියා/නීත්‍යානුකූල භාරකරු

සැ.යු: කරුණාකර පසු පිට සටහන බලන්න

**විදුහල්පති ගේ අනුමැතිය/නිර්දේශය:-**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ................ චක්‍රලේඛය අනුව 20.................................. දින සිට 20..................................දින දක්වා විදේශ නිවාඩු අනුමත කරමි/නොකරමි/විදේශගත වන කාලය දින 31ට වැඩි බැවින් විදේශ නිවාඩු නිර්දේශ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරමි.

20..................................    ......................................................

විදුහල්පති

---

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අනුමැතිය/නිර්දේශය:-**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ................ චක්‍රලේඛය අනුව 20.................................. දින සිට 20..................................දින දක්වා විදේශ නිවාඩු අනුමත කරමි/නොකරමි/විදේශගත වන කාලය මාස 06 ට වැඩි බැවින් විදේශ නිවාඩු නිර්දේශ කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරමි.

20..................................    ......................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

---

**පළාත්/ජාතික පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අනුමැතිය/නිර්දේශය:-**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ................ චක්‍රලේඛය අනුව 20.................................. දින සිට 20..................................දින දක්වා විදේශ නිවාඩු අනුමත කරමි/නොකරමි/විදේශගත වන කාලය වර්ෂ 01 ට වැඩි සහ ජාතික පාසලක ශිෂ්‍යයෙකු බැවින් විදේශ නිවාඩු නිර්දේශ කර අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙත ඉදිරිපත් කරමි.

20..................................    ......................................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

---

**ජාතික පාසල් සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) ගේ අනුමැතිය:-**

20.................................. දින සිට 20..................................දින දක්වා විදේශ නිවාඩු අනුමත කරමි/නොකරමි.

20..................................    ......................................................

අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)

- **විදේශ ගත වන සම්පූර්ණ කාල සීමාව සඳහා එකවර අනුමැතිය ලබා ගත යුතු අතර එම කාලය වසර 02 නො ඉක්මවිය යුතු ය. (වසර 02 ඉක්මවා විදේශ නිවාඩු දීර්ඝ කිරීම සිදු කරනු නොලැබේ.)**

ඇමුණුම 02

<u>රජයේ පාසල්වල අධ්‍යාපනය හදාරන අතරතුර පෞද්ගලික අවශ්‍යතා සඳහා දෙමාපියන්/භාරකරුවන් සමග විදේශගත වන සිසුන් සඳහා විදේශ නිවාඩු ලබා දීම පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම ( 01 ශ්‍රේණියට ඇතුළත් වීමෙන් පසු හා අ.පො.ස. (උ.පෙළ) විභාගයට පළමු වරට පෙනී සිටින දින තෙක්)</u>

පාසල : ..............................................................................................................

පළාත : ............................................................

පාසල අයත් වන කලාපය: .....................................

| අනු අංකය | ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය හා පන්තිය | ඇතුළත් වීමේ අංකය | විදේශගත වන රට | විදේශ නිවාඩු අනුමත කාලය ....සිට.....දක්වා | මින් පෙර ලබා ගත් විදේශ නිවාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |